# කන්ද උඩරට පිළිමතලව්ව රදල පරපුරේ ශාසනික මෙහෙවර

## (ක්‍රි.ව.1723 සිට ක්‍රි.ව.1820 තෙක්)

ඉෂාරා සුරංජි පෙරේරා[1]

පහළොස්වන සියවස අගභාගයේ මහනුවර කේන්ද්‍රකරගනිමින් සේනා සම්මත වික්‍රමබාහු රජුගෙන් ඇරඹෙන කන්ද උඩරට රාජධානිය ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගෙන් අවසානය සනිටුහන් කරයි. මේ රජවරුන්ගේ කාලය අතරතුර උඩරට රාජධානියේ බලවත් වූ එක් කොටසක් ලෙස රදලවරු හැඳින්විය හැකි අතර රදල පරම්පරා ගණනාවක් උඩරට බිහිවිය. ඒ අතරින් මදුරාපුරයෙන් සංක්‍රමණය වී නරේන්ද්‍රසිංහ රජුගේ රාජ සභාවෙන් දේශපාලන ගමන් මඟට පිවිසි පිළිමතලව්ව රදල පරපුර කාලයාගේ ඇවෑමෙන් උඩරට රදල පරම්පරා අතරින් ප්‍රමුඛස්ථානයට පත්විය. මොවුන් උඩරට දේශපාලනයට සෘජුව ම දායක වූ පිරිසක් වූවා පමණක් නොව ශාසනික කටයුතු උදෙසා ද ඇපකැප වී ක්‍රියා කළේ ය. ඒ අනුව මේ රදල පරපුර විසින් සිදුකළ ශාසනික කටයුතු පිළිබඳ ව පරීක්ෂාවට ලක්කිරීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය **අරමුණ** වී ඇත. **පර්යේෂණ ක්‍රමවේදය** වූයේ මූලාශ්‍රය අධ්‍යයනය කිරීම යි. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය රාශියක් කෙරෙහි මෙහිදී අවධානය යොමු විය. උඩරට සිහසුන දැරූ පාලකයන් ශාසනික කටයුතු උදෙසා සිදුකළ සේවයට සමාන සේවයක් මේ රදල පරපුර විසින් ද සිදුකළ බව ඔවුන් විසින් සසුනට පූජා කිරීමට යෙදුණු ගම්බිම් පූජා කිරීමේ අවස්ථා ඇසුරින් පෙනීයයි. ඒ අනුව පිළිමතලව්ව රදල පරපුර උඩරට දේශපාලනයට සෘජුව ම දායක වූ ප්‍රභූ පවුලක් වූවාසේ ම ශාසනික කටයුතු උදෙසා ද මහත් සේවාවක් සිදුකළ පරපුරක් වූ බවට මෙහිදී **නිගමනය** කළ හැකි කරුණු අතර විය.

**මුඛ්‍ය පද:** උඩරට රාජධානිය, පිළිමතලව්ව පරපුර, ශාසනික කටයුතු

[1] සහකාර කථිකාචාර්ය,ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. suranjiperera89@gmail.com